සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
තෙවන වාර පරීක්ෂණය 2018
11 ශ්‍රේණිය කෘෂි හා ආහාර තාක්ෂණය - I/II කාලය පැය 03 යි.

නම/ විභාග අංකයඃ

i. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
ii. 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැළපෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

01. ශ්‍රී ලංකාවේ මෑතකදී ඉදිකළ විශාලතම ජලාශය ලෙස සැළකිය හැක්කේ,
(1) වික්ටෝරියා ජලාශය (2) දැදුරුඔය ජලාශය
(3) රන්දෙනිගල ජලාශය (4) මොරගහකන්ද ජලාශය

02. සිසුන් පිරිසක් විසින් සරල වර්ෂාමානයක් භාවිතා කරමින් ජනවාරි ආරම්භයේ සිට වර්ෂය අවසානය දක්වා පාඨාංක ලබා ගෙන ඒවා එකතු කළ විට 2620 විය. මෙම පාසැල අයත් කළාපයක් ලෙස සැළකිය හැක්කේ,
(1) වියළි කළාපයට. (2) තෙත් කළාපයට. (3) අතරමැදි කළාපයට. (4) ශුෂ්ක කළාපයට.

03. කාලගුණික පරාමිති පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - සාපේක්ෂ ආර්ද්‍රතාව ප්‍රතිශතයක් දක්වනු ලැබේ.
B - සුළගේ වේගය පැයට කිලෝමීටර් වලින් මනිනු ලැබේ.
C - ආලෝක තීව්‍රතාව ලක්ස් වලින් මනිනු ලැබේ.

ඉහත ප්‍රකාශ අතුරින් නිවැරදි වන්නේ,
(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) B හා C පමණි. (4) A, B, C සියල්ලම.

04. අනුරාධපුරය, පොළොන්නරුව, වව්නියාව ප්‍රදේශවල බහුලව ව්‍යාප්ත වී ඇති පස් කාණ්ඩය වන්නේ,
(1) රතු කහ පොඩ්සොලික් පස (2) දියලු පස
(3) රතු දුඹුරු පස (4) රෙගසෝල් පස

05. පාංශු කැටායන හුවමාරු ධාරිතාව රඳා පවතින්නේ එම පසෙහි ...... ප්‍රමාණයක් මතය.
(1) වැලි හා රොන්මඩ (2) වැලි හා බොරළු (3) හියුමස් හා රොන්මඩ (4) මැටි හා හියුමස්

06. යම් පසක බෝග වර්ධනය ප්‍රශස්තව සිදුවීම සඳහා එම පසෙහි පැවතිය යුතු තෙතමන මට්ටම් පිළිබඳව නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) පස ජලයෙන් සංතෘප්තව තිබිය යුතුය.
(2) ක්ෂේත්‍ර ධාරිතාවේ පැවතිය යුතුයි.
(3) සංතෘප්ත හා ක්ෂේත්‍ර ධාරිතා අතර පැවතිය යුතුයි.
(4) ක්ෂේත්‍ර ධාරිතාවක් මැලවීමේ අංගයන් අතර තිබිය යුතුයි.

07. විසිරි ඛාදනය මගින් පස් අංශු වෙන්වීම අවම කළ හැක්කේ,
(1) සමෝච්ච රේඛා අනුව සීසෑමෙනි. (2) හෙල්මළු සැකසීමෙනි.
(3) පස වසුන් කිරීමෙනි. (4) සෝල්ට් (SALT) මැටි යෙදීමෙනි.

08. බණ්ඩක්කා, දෙහි, ගොටුකොළ බෝග අයත් කුල පිළිවෙලින්,
(1) මැල්වේසියේ, රූටේසියේ, අම්බලිපරේ (2) රූටේසියේ, අම්බලිපරේ, මැල්වේසියේ,
(3) මැල්වේසියේ, අම්බලිපරේ, රූටේසියේ (4) රූටේසියේ, මැල්වේසියේ, අම්බලිපරේ

09. ප්‍රාථමික බිම් සැකසීමේ උපකරණයකට උදාහරණයක් වනුයේ,
(1) රොටවේටරය (2) තැටි නගුල
(3) කොකු නගුල (4) රිජරය (ඇලි වැටි දමනය)

10. මහ කන්නයේ දී ගොවිමහතෙකු පහත සඳහන් බෝග වගා කරයි. බතල, ගස්ලබු හා මිරිස් එම බෝග වේ. ඔහු සැකසිය යුතු වගා පාත්ති වර්ග පිළිවෙලින්,
   (1) තනි වගා වලවල්, උස් පාත්ති, වැටි හා කාණු
   (2) වැටි හා කාණු, උස් පාත්ති, තනි වගා වලවල්
   (3) උස් පාත්ති, වැටි හා කාණු, තනි වගා වලවල්
   (4) වැටි හා කාණු, තනි වගා වලවල්, උස් පාත්ති

11. තවානක ඇති පැල ක්ෂේත්‍රයේ සිටුවීමට සුදුසු තත්වයට හුරු කිරීම හඳුන්වන්නේ,
   (1) පැල දැඩි කිරීම ලෙසය.
   (2) පැල වසන්තී කරණය ලෙසය.
   (3) පැල ජීවානුහරනය ලෙසය.
   (4) පැල වල සුප්තතාවය ඉවත්කිරීම ලෙසය.

12. පහත දැක්වෙන ජල සම්පාදන ක්‍රම අතුරින් වැඩිපුරම ජලය සංරක්ෂණය වන ක්‍රමය වනුයේ,
   (1) විසුරුම් ජල සම්පාදනය
   (2) බේසම් ජල සම්පාදනය
   (3) ඇලි ජල සම්පාදනය
   (4) බිංදු ජල සම්පාදනය

13. ඉල්මැස්ස පාලනය සඳහා වඩාත් ඵලදායි ක්‍රමය වනුයේ,
   (1) කොහොඹ නිස්සාරණය ඉසීම.
   (2) මැස්සා ඇතින් අල්ලා විනාශ කිරීම.
   (3) පෙරමෝන උගුල භාවිතය.
   (4) ආලෝක උගුල භාවිතය.

14. ගඳපාන හා විඩේලියා යනු,
   (1) ඒක දේශිත ඖෂධ පැලෑටියි.
   (2) ආගන්තුක ජලජ පැලෑටියි.
   (3) කොළ පොහොර සඳහා ක්ෂේත්‍රයේ වගාකරන බෝගයි.
   (4) ආගන්තුක ආක්‍රමනශීලී පැලෑටියි.

15. රසායනික පළිබෝධ නාශක භාවිතා කිරීම හා සම්බන්ධ අසත්‍ය ප්‍රකාශය තෝරන්න.
   (1) රසායනික පළිබෝධ නාශක අදිකව යෙදූ ආහාර ප්‍රමානාත්මක ව හා ගුණාත්මක බවින් වැඩිය.
   (2) පලිබෝධ නාශක වල ආරක්ෂිත කාලය ගත වූ පසු යෙදූ බෝග පරිභෝජනයට සුදුසුය.
   (3) නිර්දේශිත සාන්ද්‍රණයට මිශ්‍ර කිරීම කළ යුතුය.
   (4) අවසානයේ ඉසිනය සෝදන ජලය ජල මාර්ග වලට නොදැමිය යුතුය.

16. අසම්පූර්ණ ජීවන චක්‍රය හිමි පළිබෝධකයෙකි,
   (1) කළු පොල් කුරුමිණියා
   (2) අවුලක පේරා
   (3) ඉල්මැස්සා
   (4) ගොයම් මකුණා

17. පටක රෝපණයෙන් නිපදවන පැළ පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

   A - පටක රෝපණයෙන් ලැබෙන පැළ මව් ශාකයේ ලක්ෂණ පෙන්වයි.
   B - පටක රෝපණයෙන් විශාල පැළ සංඛ්‍යාවක් නිපදවිය හැක.
   C - පටක රෝපණයෙන් ලැබෙන පැළ පළිබෝධ හානිවලට ඔරොත්තු දෙයි.
   D - පටක රෝපණයෙන් ලැබෙන පැළ බීජ පැළ වලට වඩා ශක්තිමත්ය.

   මෙම ප්‍රකාශ වලින් සත්‍ය ප්‍රකාශ වන්නේ,
   (1) A හා C ය.
   (2) A හා B ය.
   (3) C හා D ය.
   (4) B හා C ය.

18. දඬු කැබලි මුල් ඇද්දවීමේදී දණ්ඩේ පහල කැපුම් කෙළවර ආනතව කපනු ලබන්නේ,
   (1) හෝමෝන ආලේප කිරීමටය.
   (2) මුල් අදින පෘෂ්ඨය වැඩිකර ගැනීමට.
   (3) ඍජුව සිටුවීම පහසුවීමටය.
   (4) කැපුම් කෙලවර වියලීයාම වලක්වා ගැනීමටය.

19. බීජ ප්‍රරෝහණ ප්‍රතිශතය සෙවීමේ පරීක්ෂණයක් සඳහා බීජ 200 ක් යොදාගත් අතර ඉන් බීජ 20 ක් නරක් වී තිබුණි. මෙම බීජ සාම්පලයේ ප්‍රරෝහණ ප්‍රතිශතය කොපමණ ද?
   (1) 90%
   (2) 40%
   (3) 80%
   (4) 20%

20. කිරිඅල ශාකයේ දක්නට ඇත්තේ පහත කුමන වර්ධක ප්‍රචාරණ ව්‍යුහයක් ද?

(1) රෛසෝම (2) කෝම (3) බල්බිල (4) මොටියන්

21. මෙම වසරෙහි ලංකාවේ දිස්ත්‍රික්ක කිහිපයක වී වගාවට වසංගත තත්වයක් ඇතිකළ පළිබෝධ හානිය කුමක් ද?

(1) ගොක් මැස්සාගේ හානියයි. (2) ගොයම් මකුණාගේ හානියයි.

(3) දුඹුරු පැළ කීඩෑවාගේ හානියයි. (4) පුරුක් පණුවාගේ හානියයි.

22. බඩ ඉරිඟු වගාවක දැකිය හැකි නයිට්‍රජන් ඌණතා ලක්‍ෂණයක් වන්නේ,

(1) මේරූ පත්‍ර කහපාට වීම. (2) පත්‍ර දාර කහපාට වීම.

(3) මේරූ පත්‍ර දම්පාට වීම. (4) මුල් වල පැතිරීම අඩුවේ.

23. පොහොර භාවිතය කාර්යක්‍ෂමතාව ඉහළ නැංවීම සම්බන්ධයෙන් ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - ඒකාබද්ධ ශාක පෝෂක කළමනාකරණ මූලධර්ම අනුගමනය කිරීම.

B - දේශගුණික තත්වය.

C - වගාවේ අවස්ථාවට සුදුසු පොහොර වර්ග තෝරා ගැනීම.

ඉහත ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශ තෝරන්න.

(1) A හා B (2) A හා C

(3) B හා C (4) A, B හා C යන සියල්ලම.

24. පැරශුට් ක්‍රමය සඳහා යොදාගත හැකි තවාන් ක්‍රමයක් තෝරන්න.

(1) ඩැපොග් තවාන් (2) මඩ තවාන් (3) ගොඩ තවාන් (4) තැටි තවාන්

25. නිර්පාංශු වගාවේදී රෝපණ මාධ්‍ය ලෙස කොහුබත් යොදා ගැනීමට පෙර එය හුමාලයෙන් තැම්බීම සිදු කිරීමට හේතුව නම්,

(1) වාතනය දියුණු කිරීමටය. (2) රෝග කාරකයින් විනාශ කිරීමටය.

(3) විෂ රසායනික ද්‍රව්‍ය ඉවත් කිරීමටය. (4) අනවශ්‍ය ජලය ඉවත් කිරීමටය.

26. එක් අතු කැබැල්ලක් පමණක් පහසුවෙන් මුල් අද්දවා ගැනීමට සකසනු ලබන ව්‍යුහයක් වන්නේ,

(1) සරල සූර්ය ප්‍රචාරකය වේ. (2) පොලිතීන් ගෘහ වේ.

(3) ඒකීය සූර්ය ප්‍රචාරකය වේ. (4) දැල් ගෘහයක වේ.

27. වීදි බෝග වගාවේදී යොදා ගන්නා බහු වාර්ෂික ශාක අයත්වන පිළිතුර වන්නේ,

(1) ග්ලිරිසිඩියා සහ රබර් ය. (2) ග්ලිරිසිඩියා සහ කතුරුමුරුංගා ය.

(3) රබර් සහ කෙසෙල් ය. (4) රබර් සහ කතුරුමුරුංගා ය.

28. අස්වනු නෙලීමේදී නටුවේ දිග නියමිත ප්‍රමාණයට නොතිබීම නිසා ඵලයට හානිවන බෝග වර්ගය වන්නේ,

(1) අන්නාසි (2) ගස්ලබු (3) අඹ (4) රඹුටන්

29. පුද්ගලයින් කරන කාර්ය අනුව ඔවුන්ගේ පෝෂණ අවශ්‍යතා විවිධ වේ. පහත පුද්ගලයින් අතරින් ශක්ති ජනක ආහාර වැඩිපුරම අවශ්‍ය වනු ඇත්තේ,

(1) පාසල් ළමුන්ටය. (2) බර වැඩ කරන පිරිමින්ටය.

(3) ගර්භනී මව්වරුන්ටය. (4) කිරිදෙන මව්වරුන්ටය.

30. ජෑම්, කෝඩියල් සකස් කිරීමේදී යොදා ගනු ලබන පරිරක්‍ෂක ද්‍රව්‍යයක් නම්,

(1) මොනොසෝඩියම් ග්ලුමමේට් (2) සෝඩියම් මෙටා බයිසල්පයිට්

(3) සෝඩියම් නයිට්‍රේට් (4) සෝඩියම් නයිට්‍රයිට්

31. ආහාර කල් තබා ගැනීම පිළිබඳව ප්‍රකාශ 03 ක් පහත දක්වා ඇත.

A - බ්ලාන්චිකරණය ලෙස හඳුන්වන්නේ ආහාරවල ඇති එන්සයිම අක්‍රීය කිරීම වේ.

B - යෝගට් නිෂ්පාදනය කිරීමේදී එය පැසවීමට යොදා ගනු ලබන ක්ෂුද්‍ර ජීවී විශේෂය වන්නේ ස්ට්‍රෙප්ටොකොකස් ලැක්ටිස් ය.

C - පැස්ටරීකරණය කරන ලද කිරි කාමර උෂ්ණත්වයේ ගබඩා කළ හැකිය.

මින් සත්‍ය පිළිතුර වනුයේ,

(1) A හා B ය. (2) B හා C ය. (3) A හා C ය. (4) A, B හා C ය.

32. කිරි පිටි නිෂ්පාදනයේ දී භාවිතා කරන ආහාර පරිරක්ෂණ ක්‍රමය කුමක් ද?

(1) පැස්ටරීකරනය (2) විසිරි වියළීම (3) ජීවානුහරනය (4) සූර්‍යතාප වියළීම

33. බිත්තර ලබාගැනීම සඳහා ඇතිකර කුකුළු ප්‍රභේදය කුමක් ද?

(1) ලෙගෝන් (2) ඔස්ට්‍රොලොප් (3) RIR (4) ලෝමාන්

34. කුකුලන් ඇති කිරීමේ විස්තිරණ ක්‍රමයේ වාසියක් විය හැක්කේ,

(1) විලෝපිත හානි වැඩිය. (2) පරපෝෂිත හානි වැඩිවීම.

(3) බිත්තර වැඩි මිලකට අලවි කිරීමට හැකිය. (4) බිත්තර නිෂ්පාදනය අඩුය.

35. ගවයන්ට දෙන සාන්ද්‍ර ආහාරයකි,

(1) පුන්නක්කු (2) අල (3) පිදුරු (4) ග්ලිරිසිඩිය

36. දෙනකගේ වියලි කාලය දින,

(1) 285 (2) 305 (3) 60 (4) 21

37. කිරි නිෂ්පාදනය සඳහා සෘජුවම බලපාන රෝගයකි,

(1) කිරි උණ (2) බුරුළු ප්‍රදාහය

(3) කාලගාත්‍ර රෝගය (4) කුර හා මුඛ රෝගය

38. ෆ්‍රිෂියන්, අයර්ශයර්, ජර්සි යන ගව ප්‍රභේද ඇතිකළ හැක්කේ කුමන ගව පාලන කලාපයක ද?

(1) පොල් ත්‍රිකෝණය (2) යාපන අර්ධද්වීපය

(3) මැදරට කලාපය (4) උඩරට කලාපය

39. ශ්‍රී ලංකාව තුල ආහාර නිෂ්පාදනය, සැකසීම, ගබඩා කිරීම හා බෙදා හැරීම හා විකිණීම පිළිබඳව පනත කුමක් ද?

(1) 1986 අංක 20 දරණ ආහාර පනත.

(2) 1980 අංක 26 දරණ ආහාර පනත.

(3) 1981 අංක 21 දරණ ආහාර පනත.

(4) 1985 අංක 30 දරණ ආහාර පනත.

40. මෙහි දක්වෙන සංකේතයෙන් කියවෙන්නේ,

(1) පරිසර හිතකාමී ඇසුරුමක් බව.

(2) අයනික විකිරණ ප්‍රමිතිකරණයට භාජනය කරන ලද ආහාරයක් බව.

(3) ප්‍රතිචක්‍රීකරණයට ලක්කල හැකි බඳුනක් බව.

(4) ක්ෂුද්‍රජීවීන්ගෙන් තොරවූ ආහාරයක් බව.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
තෙවන වාර පරීක්ෂණය 2018
11 ශ්‍රේණිය කෘෂි හා ආහාර තාක්ෂණය - II

නම/ විභාග අංකයඃ

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 යි. තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් හිමි වේ.

---

(01) තිරසාර සංවර්ධන වැඩ සටහන යටතේ පාසැල තුළ ක්‍රියාත්මක වන වැඩසටහන යටතේ පාසැල තුළ ක්‍රියාත්මක වන ආදර්ශ ගෙවත්ත කාගේත් ප්‍රසංශාවට ලක්විය. එය නඩත්තුව පිණිස සිදුකෙරෙන විවිධ ක්‍රියාකාරකම් අතර නිරන්තර පාංශු සංරක්ෂණය, ජල සම්පාදනය, පළිබෝධ පාලනය, අතුරුයත් ගැම වැනි ක්‍රියා සිදුකළ යුතුය.

i. අතුරුයත් ගැම සඳහා යොදාගන්නා ක්‍රියාකාරකම් 02 ක් සඳහන් කර ඒ සඳහා යොදාගන්නා උපකරණ 02 ක් ලියා දක්වන්න.

ii. සම්භවය අනුව පාෂාණ වර්ග තුන නම් කරන්න.

iii. ගෙවත්තේ වගාකර තිබූ ප්‍රෝටීන් ලබාදෙන බෝග වර්ග 02 ක් ලියන්න.

iv. ගොවිපලේ තිබූ අඹ, කෙසෙල්, පැපොල් ආදී පළතුරු වගාවට ඇතිවිය හැකි දිලීර රෝගයක් සඳහන් කරන්න.

v. ගෙවත්තේ පස තරමක් ආම්ලික වූ නිසා එය සුදුසු තත්වයට පත් කිරීමට යෙදූ ද්‍රව්‍ය 02 ක් ලියන්න.

vi. මෙම බිමේ ජලවහනය දියුණු කිරීමට යෙදූ කාණු රටා ආකාර 02 ක් ලියන්න.

vii. පාසැල් ගෙවත්තේ ලබාගත හැකි ස්වාභාවික ඇසුරුම් 02 ක් ලියන්න.

viii. ගෙවත්තේ ඇති පළතුරු පැළ සඳහා යොදාගත් ප්‍රධාන බද්ධ ක්‍රම 02 වෙන වෙනම ලියන්න.

ix. එහි ස්ථානගත කර තිබූ කෘෂි කාලගුණික දත්ත ලබාගත හැකි උපකරණ 02 ක් දක්වා මිනුම් ලබාගන්නා ඒකක දක්වන්න.

x. සත්ව ගොවිපලේ කුකුළ් ආස්තරණයට යොදා තිබූ ද්‍රව්‍ය 02 ක් සඳහන් කරන්න.

(ලකුණු $2 \times 10 = 20$)

(02) නිසරු වූ ඉඩමක ක්ෂේත්‍ර බෝග හා එළවළු වගා කිරීමට ඇති යෝග්‍යතාව පිළිබඳ පරීක්ෂණ වාර්තාවකින් උපුටාගත් කරුණු කිහිපයක් පහත දැක්වේ.

- ඉඩම මඳක් බෑවුම් සහිතයි.
- බොහෝ ස්ථානවල උඩුපස සේදී ගොස් ඇත.
- වල්පැලෑටි ඇතත් නිසරුයි.
- උග්‍ර ලෙස හායනයට ලක්වී ඇත.

i. (a) පස උග්‍ර ලෙස හායනයට ලක්වී ඇත යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?

(b) බෑවුම් සහිත බිමේ මතුපිට ජලය ගලායෑමේ වේගය අඩු කිරීමට ගන්නා පාංශු සංරක්ෂණ ක්‍රියාමාර්ග හතරක් ලියන්න.

ii. බෝගවල නිෂ්පාදන ශක්තිය වැඩිකිරීම සඳහා කාබනික ද්‍රව්‍ය එක් කිරීම එක් ක්‍රියාමාර්ගයකි. වගා බිමට කාබනික ද්‍රව්‍ය යෙදීමේ වැදගත්කම් 03 ක් ලියන්න.

iii. ශ්‍රී ලංකාවේ පවතින ප්‍රධාන වගා කන්න නම්කර ඒවාට අදාල මෝසම් වර්ගය නම්කර ඒවා පවතින මාස ලියා දක්වන්න.

(03) පාසැලේ පැවැත්වෙන සංවත්සරික දිනට සමගාමීව පැවැත්වෙන ප්‍රදර්ශනය සඳහා පාසැල් ගොවිපල සැකසීම හා පවත්වාගෙන යාම 11 වසර වල දරුවන්ට පැවරී තිබුණි.

11 A පංතිය	-	බිම සැකසීම
11 B පංතිය	-	තවාන් සැකසීම
11 C පංතිය	-	ජල සම්පාදන කටයුතු
11 D පංතිය	-	පළිබෝධ පාලනය

i. (a) බිම් සැකසීමට ඔවුන් යොදාගත් මිනිස් බලයෙන් ක්‍රියාකරන කාර්‍යක්ෂම උපකරණය කුමක් ද?

(b) බිම් සැකසීමේදී ඔවුන් කළ ක්‍රියාකාරකම් 04 ක් දක්වන්න.

ii. 11 B පංතියේ සිසුන් තවාන් සැකසීමේ දී පස් කුට්ටිය සමග පැල වෙන්කරගත හැකි ක්‍රමයක් යොදාගත් අතර 11 C පංතියේ සිසුන් වැස්සක් ආකාරයට බෝග වලට ජලය ලැබෙන ක්‍රමයක් ක්‍රියාත්මක කළේය.
   (a) 11 B සිසුන් යොදාගත් තවාන් ක්‍රමය කුමක් ද?
   (b) එහි තවාන් මිශ්‍රනය සෑදීමට යොදාගත් ද්‍රව්‍ය හා අනුපාතය ලියා දක්වන්න.
   (c) එහි කුට්ටියක විශාලත්වය දළ වශයෙන් දක්වන්න.
   (d) 11 C සිසුන් යොදාගත් ජල සම්පාදන ක්‍රමය හා එම ක්‍රමයේ වාසි 02 ක් දක්වන්න.

iii. පළිබෝධ පාලනය පැවැරී තිබුණ දරුවන් පහත කෘමින් දෙදෙනා අල්ලගෙන තිබුණි.



   (a) මෙම කෘමින් දෙදෙනා හඳුනා ගන්න.
   (b) A හා B හි හානියේ ස්වභාවය වෙන වෙනම ලියා දක්වන්න.
   (c) A කෘමියාගේ ජීවන චක්‍රයේ අවස්ථා දක්වන්න.

(04) ශාකවල පැවැත්ම සඳහා පරිසරය තුළ සොබාවිකව සිදුවන ශාක ප්‍රචාරණ ක්‍රමය ලිංගික ප්‍රචාරණයයි. එහිදී බීජ මගින් විශේෂ කාර්යක් ඉටුකෙරේ.
i. (a) බීජ ප්‍රරෝහණයට අවශ්‍ය සාධක 02 ක් ලියන්න.
   (b) ප්‍රධාන බීජ ප්‍රරෝහණ ආකාර සඳහන් කර ඒවාට උදාහරණ 02 බැගින් ලියන්න.
ii. (a) අවශ්‍ය සාධක ලැබුණද ඇතැම් බීජ ප්‍රරෝහණය නොවේ. එම තත්වය හැඳින්වෙන නම කුමක් ද?
   (b) ඉහත තත්වය ඇතිවීමට බලපාන සාධක 02 ක් ලියන්න.
   (c) ඉහත ආකාරයට ප්‍රරෝහණය නොවන ඇතැම් බීජවල එම තත්වය ඉවත් කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග 02 ක් උදාහරණ සහිතව ලියන්න.
iii. ඒක බීජ පත්‍රී බීජවල හා ද්වීබීජ පත්‍රී බීජ වල ආහාර සංචිත වී ඇති ප්‍රධාන කොටස වෙන වෙනම සඳහන් කරන්න.

(05) ශ්‍රී ලාංකිකයන්ගේ ප්‍රධාන ආහාරය ලෙස වී වගාවට ප්‍රමුඛස්ථානයක් හිමි වේ. එනිසා වී වගාව පිළිබඳ මනා අවබෝධයක් ලබා සිටීම ශ්‍රී ලාංකිකයින් වන අපට ඉතා ප්‍රයෝජනවත් වේ.
i. (a) වී වගාව සඳහා අප රටේ පවතින විභවයන් 03 ක් ලියන්න.
   (b) ගොයම් ශාකයේ වර්ධන අවධි නම් කරන්න.
ii. (a) මාස 3½ ක් වයස වී ප්‍රභේදයක් ඉහත වර්ධන අවධි සඳහා ගතකරන කාලසීමාවන් වෙන වෙනම සඳහන් කරන්න.
   (b) වී වගාව සමග වැඩෙන වල්පැළෑටි 02 ක් සඳහන් කරන්න.
iii. වී වගාවේ පළිබෝධ පාලනයට යොදාගත හැකි පරිසර හිතකාමී ක්‍රියාමාර්ග 02 ක් ලියන්න.

(06) පාලිත තත්ව යටතේ බෝග වගා කිරීම තුළින් අස්වැන්නේ ගුණාත්වය මෙන්ම අස්වනු හානියද අවම කර ගත හැක.
i. (a) පාලිත තත්ව යටතේ බෝග වගාකිරීමට භාවිතා කරන ස්ථිර වගා ව්‍යුහ 04 ක් නම් කරන්න.
   (b) පොලිතීන් ගෘහ තුල උෂ්ණත්වය වැඩිවීම වළක්වා ගැනීමට යොදාගත හැකි උපක්‍රම 02 ක් ලියන්න.
   (c) නිර්පාංශු වගාවේ ඇති වාසි 02 ක් ලියන්න.
ii. (a) පසු අස්වනු හානිය යනු කුමක් දැයි හඳුන්වන්න.
   (b) පෙර අස්වනු සාධක කළමනාකරණයේ දී යොදා ගන්නා උපක්‍රම 02 ක් ලියන්න.
   (c) වැටකොලු, පතෝල, කරවිල වැනි බෝගවල අස්වනු විශාල ප්‍රමාණයක් ගොවිපලේ දී අපතේ යාම වලක්වා ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාගී 02 ක් ලියන්න.

(07) සත්ත්ව පාලනය කිරීමේදී ගව පාලනය හා කුකුළු පාලනය වැදගත් වේ.
i. (a) ශ්‍රී ලංකාව තුළ සත්ත්ව පාලනය දියුණු කිරීමට පවතින විභවයන් 03 ක් සඳහන් කරන්න.
   (b) ඉන්දීය ගව වර්ග හා යුරෝපීය ගව වර්ග අතර ඇති රූපීය වෙනස්කම් 03 ක් සඳහන් කරන්න.
ii. ප්‍රසූතියෙන් පසු ගව පැටවකු පිළිබඳව ක්‍රියා කළයුතු ආකාරය පිළිබඳව වැදගත් කරුණු 04 ක් ලියන්න.
iii. බ්‍රොයිලර් සතුන්ට එන්නත් ලබාදෙන රෝගය 02 ක් සඳහන් කරන්න.

පිළිතුරු පත්‍රය - I කොටස

1 -(4)	2 -(2)	3 -(4)	4 -(3)	5 -(4)	6 -(2)	7 -(3)	8 -(1)	9 -(2)	10 -(4)
11-(1)	12 -(4)	13 -(3)	14 -(4)	15 -(1)	16 -(4)	17 -(2)	18 -(2)	19 -(1)	20 -(2)
21-(3)	22 -(1)	23 -(4)	24 -(4)	25 -(2)	26 -(3)	27 -(2)	28 -(1)	29 -(2)	30 -(2)
31-(1)	32 -(2)	33 -(1)	34 -(3)	35 -(1)	36 -(3)	37 -(2)	38 -(4)	39 -(2)	40 -(2)

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින් හිමි වේ.)

II කොටස

(01) i. උදැල්ල, උදළු මුල්ලුව, අත්මුල්ලුව, අතින් ක්‍රියාකරවන හෝ වර්ග, වල් මර්ධනය, පැළ අවට බුරුල් කිරීම, පැළ මුලට පස් එකතු කිරීම (ල.½x2)

ii. ආග්නේය පාෂාණ, අවසාදිත පාෂාණ, විපරිත පාෂාණ (තුනම ලියා ඇත්නම් ල.02)

iii. මුං, කව්පි, සෝයා බෝංචි, රටකජු, දඹල (ල.02)

iv. ඇන්ත්‍රැක්නෝස් (ල.02)

v. පසට හුණු යෙදීම (කැල්සියම් කාබනේට්, ඩොලමයිට්, හුණුගල්) (ල.02)

vi. සමාන්තර (ගිරිඩි අයන්) ක්‍රමය, හෙරින්බෝන් කාණු රටා (ල.02)

vii. පොල් අතු, කෙසෙල් පරඬැල්, කෙසෙල් කොළ, කොළපොත, පොල් අතු කුඩ (ල.02)

viii. අංකුර බද්ධය, රිකිළි බද්ධය (ල.02)

ix. • වර්ෂාමානය - mm • සුළඟේ වේගය (අනිලමානය) - kmh^{-1} • උෂ්ණත්වමානය - ^0C (ල.02)

x. දහයියා, ලීකුඩු, රටකජු පොතු, කුඩාවට කැපූ පිදුරු කැබලි (ල.02)

(ලකුණු 2 × 10 = 20)

(02) i. (a) අවිධිමත් කෘෂිකාර්මික කටයුතු ඇතුළු විවිධ මිනිස් ක්‍රියාකාරකම් හේතු කොටගෙන ඛාදනය වීමෙන් හෝ පසේ භෞතික, රසායනික හා ජෛව ගුණාංග වගාවට අයහපත් වීමෙන් පසේ බෝග නිෂ්පාදන ශක්තිය හීනවීම පාංශු හායනයයි. (ල.02)

(b) • සමෝච්ච රේඛා අනුව සී සෑම • සමෝච්ච රේඛා අනුව වගා කිරීම
• සමෝච්ච රේඛා මත පස් වැටි දැමීම • හෙල්මළු සැකසීම
• සමෝච්ච කාණු යෙදීම • සේල්ට් වැටි යෙදීම (ල.½x4=2)

ii. • පසේ ජලය රඳවා ගැනීමේ ධාරිතාව වැඩි කරයි.
• ශාක වර්ධනයට අවශ්‍ය පෝෂක රදවා තබා ගැනීමේ සංචිත ලෙස ක්‍රියා කරයි.
• පාංශු ඛාදනය අඩු කරයි.
• පාංශු ක්ෂුද්‍රජීවීන්ගේ වර්ධනයට අවශ්‍ය උපස්තර ලෙස ක්‍රියා කරයි.
• පසේ ජලවහනය දියුණු කරයි. (ල.1×3=3)

iii. • යල - නිරිත දිග මෝසම - මැයි සිට සැප්තැම්බර් දක්වා
• මහ - ඊසාන දිග මෝසම - නොවැම්බර් සිට පෙබරවාරි දක්වා (ල.1×3=3)

(03) i. (a) උදැල්ල (ල.01)

(b) • වල් පැල / ගල් මුල් ආදිය ඉවත් කිරීම • බිම පෙරළීම
• කැට පොඩිකිරීම / මට්ටම් කිරීම • පාත්ති සැකසීම
• පසට පොහොර මිශ්‍ර කිරීම (ල.½x4=2)

ii. (a) නොරිඩෝකෝ තවාන් (කුට්ටි තවාන) (ල.01)

(b) මතුපිට පස් කොම්පෝස්ට් 1:1 මිශ්‍රණය (ල.½)

(c) 5cm x 5cm x 5cm (ල.½)

(d) ඉසින (විසුරුම්), ජල සම්පාදනය (ල.01) වාසි 02 ක් දැක්වීම (ල.½x2=1)

iii. (a) A - අවුලක පෝරා B - එපිලැග්නා (ල.½x2=1)

(b) A - පත්‍ර සිදුරුවන ලෙස කා දැමීම. B - පත්‍ර දැලක් ආකාරයට කා දමා තිබීම. (ල.½x2=1)

(c) (ල.01)



(04) i. (a) • බීජයේ ජීව්‍යතාව • තෙතමනය / ජලය • වාතය / ඔක්සිජන්
• ප්‍රශස්ත උෂ්ණත්වය • ආලෝකය (ල.02)

(b) • අධෝභෞම ප්‍රරෝහණය - වී, කඩල, බඩඉරිඟු
• අපිභෞම ප්‍රරෝහණය - මුං, බෝංචි, බටු, මිරිස් (ල.02)

ii. (a) බීජ සුප්තතාවය (ල.01)

(b) • අපාරගම්‍ය බීජාවරණ පැවතීම • ඝන බීජාවරණ පැවතීම
• නිශේධක පැවතීම • අපරිනත කලල පැවතීම

- අක්‍රීය කලල පැවතීම (ල.02)

(c)
- බීජාවරණය ඉවත් කිරීම - අඹ
- ජලයේ පෙඟවීම - වී, කව්පි, මුං
- අම්ල ද්‍රාවන තුල ගිල්වීම - දඹල
- බීජාවරණය පිළිස්සීම - තේක්ක (ල.02)

iii.
- ඒක බීජ පත්‍රී බීජ - භ්‍රෑණ පෝෂය
- ද්වි බීජ පත්‍රී බීජ - බීජ පත්‍ර (ල.01)

(05) i. (a)
- සෑම ප්‍රදේශයකම වගා කල හැක.
- පර්යේෂණ හා අභිජනන මධ්‍යස්ථාන ප්‍රාදේශීයව පිහිටුවා තිබීම.
- විවිධ දේශගුණික තත්ව වලට ගැලපෙන වී වර්ග තිබිම.
- රාජ්‍ය අනුග්‍රහය (ල.03)

(b) වර්ධක අවධිය / ප්‍රජනක අවධිය / මේරීමේ අවධිය (ල.0)

ii. (a)
- වර්ධක අවධිය - දින 45
- ප්‍රජනක අවධිය - දින 30
- මේරීමේ අවධිය - දින 30 (ල.03)

(b) බටදැල්ල, දිය හබරල, තුනැස්ස (ල.01)

iii.
- දිය හොල්මන
- ආලෝක උගුල්
- පොල් පිති ගැසීම
- කුළු ගෑම, ලනු ගෑම (ල.02)

(06) i. (a) පොලිතීන් ගෘහ, දැල් ගෘහ, වීදුරු ගෘහ, ලී පටි ගෘහ, හරිතාගාර (ල.½x4=02)

(b)
- වහලයේ මුදුන මට්ටම් 02 කට සෑදීම.
- වහලයට සවිකල පංකා
- පැති බිත්තිවලට සවිකල පංකා
- විවෘත කල හැකි කවුලු යෙදීම
- කෘමි පලිබෝධ වලකන දැල් භාවිතය
- නල මගින් ජල සම්පාදනය මීදුමක් ආකාරයට ඉසීම (ල.02)

(c) කුඩා ඉඩක් අවශ්‍ය වීම, අහිතකර පාංශු තත්ව වලට බෝග ලක් නොවීම, ගුණාත්මක අස්වනු ලැබීම, ශ්‍රමය අඩුවීම, රෝග හා කෘමි හානි අවම වීම, බිම් සැකසීම හා ජල සම්පාදනය, වල් මර්ධනය අවශ්‍ය නොවීම, අඛණ්ඩ වගාවක් ලෙස කරගෙන යාම. (ල.01)

ii. (a) බෝගයක අස්වනු නෙලීමෙන් පසු එය පාරිභෝගිකයා අතට පත්වීමට පෙර එම අස්වනු වලට සිදුවන හානිය වේ. (ල.01)

(b)
- ප්‍රදේශයට ගැලපෙන පරිදි බෝග තෝරා ගැනීම.
- භූමිය තෝරා ගැනීම.
- ගුණාත්මක රෝපණ ද්‍රව්‍ය භාවිතා කිරීම.
- දේශගුණික සාධකවල බලපෑම අවම කිරීම.
- ජල සම්පාදනය
- පොහොර යෙදීම
- පලිබෝධ පාලනය (ල.02)

(c)
- අස්වනු නෙලීමේදී උදේ/සවස කාලය භාවිතා කිරීම.
- ක්ෂේත්‍ර තාපය අවම කිරීම.
- අස්වනු එකට ගොඩ නොගැසීම.
- යාන්ත්‍රික හානි අවම කිරීම.
- නෙලාගත් අස්වනු සෙවන ඇති ස්ථානයක තැබීම.
- අස්වනු රැස්කිරීමට ගොවිපලෙහිම ස්ථානයක් තිබීම. (ල.02)

(07) i. (a)
- විවිධ දේශගුණික කලාප පිහිටා තිබීම.
- වියලි කලාපීය බෝගවල අවශේෂ සත්ව ආහාර ලෙස යොදාගත හැකිවීම.
- සීනි හා ශාක තෙල් නිස්සාරණයේ අතුරුඵල ලාභදායී සත්ත්ව ආහාර වීම.
- රැකියා විරහිත පුද්ගලයන් ඒ සඳහා යොමු කළ හැකි වීම.
- ණය යෝජනා ක්‍රම හා රක්ෂණ ක්‍රම ක්‍රියාත්මක වීම.
- උදව් කරන රාජ්‍ය හා පෞද්ගලික ආයතන රැසක් තිබීම.
- නොමිලේ පශු වෛද්‍ය සේවය පැවැත්වීම. (ල.03)

(b) <u>ඉන්දීය</u>
ශරීරය සාපේක්ෂව කුඩාය. / මොල්ලිය මනාව වර්ධනය වී ඇත. / තැල්ල පෙකනි පෙත්ත මනාව වර්ධනය වී ඇත. / ශරීරය පිටුපස රවුම්ය.
<u>යුරෝපීය</u>
ශරීරය සාපේක්ෂ විශාලය / මොල්ලිය මනාව වර්ධනය වී නොමැත. / තැල්ල පෙකනි පෙත්ත මනාව වර්ධනය වී නැත / ශරීරය පිටුපස රවුම් නැත. (ල. ½x6=03)

ii.
1. ගව දෙන පැටවා ලෙවකා පිරිසිදු නොකලහොත් පැටවා ඉපදුනු විගස රෙදිකඩකින් මුඛයේ නාස්වල ඇති ශ්ලේෂ්මල ඉවත් කර හොඳින් පිසදැමීම.
2. පෙකනිවැල පෙකනියේ සිට 7-8cm ක් ඉතිරිවනසේ අඹරා කැපීම. පසුව අයඩින් වැනි විෂබීජ නාශකයක් ගැල්වීම.
3. පෙකනියේ මැස්සන් වැසීම මගහැරීම සඳහා කොහොඹ තෙල් ගැල්වීම.
4. පැටවා ඉපදී පැය ½ ක් ඇතුලත මුල් කිරි උරාබීමට ඉඩ සැලසීම. (ල. ½ x 4 = 02)

iii. බ්‍රොන්කයිටිස් / රැනිකට් / ගම්බෝරෝ (ල. 1 x 2 = 02)